## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය - 2018

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක්ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහ අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කළ යුතු වුවද, පිරිවැය රු.2,918,392 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනයකින් තොරව මණ්ඩලයේ භාවිතයට ගෙන තිබුණි. | අදාළ දේපළ පිරියත උපකරණ සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් දී ඇත. | වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කළ යුතු වේ. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන ක්‍රමක්ෂයට අදාළ විලම්බිත ආදායම් වටිනාකම රු.292,361 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කර නිවැරදි කිරීම් කරන ලෙස උපදෙස් දී ඇත. | රජයේ ප්‍රදාන ක්‍රමක්ෂයට අදාළ විලම්බිත ආදායම් වටිනාකම නිවැරදිව ගිණුම්ගතකළ යුතු වේ. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදීජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 756 | මණ්ඩලයේ ඇති බඩු හරි වැරදි බැලීම සඳහා ද අවශ්‍ය තැන්හිදී පාවිච්චියට ගත නොහැකි බඩු ගැන වාර්තා කිරීම සඳහා ද සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වන දින හෝ එකී දිනට ආසන්නව සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වුවද 2019 ජනවාරි 25 වන දින සමීක්ෂණ මණ්ඩලය පත් කර තිබුණු අතර 2019 මැයි 03 දින වන විටත් එහි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නොවැළැක්විය හැකි හේතූන් මත මණ්ඩලයේ සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන් නිවාඩු ගොස් ඇති බැවින් වාර්තාව ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී ඇත. ඉදිරියේ දී ඉදිරිපත් කරනු ඇත. | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වන දින හෝ එකී දිනට ආසන්නව සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වේ. |
| (ii) මුදල් රෙගුලාසි 880 | රජයේ මුදල් භාර ගැනීම හෝ භාරව සිටින නිලධාරීන්, රජයේ ගිණුම්වලට අදාළ ගෙවීම් වවුචර සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන් ,ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් මණ්ඩලය තුළ අදාළ කාර්යයන්හී නියුක්ත නිලධාරීන් දෙදෙනෙකුගෙන් විගණන දිනය වූ 2019 මැයි 15 දක්වාම ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබීම හා ඊට අදාළ නිර්ණායකයන් පිළිබඳව සොයා බලා ඒ සම්බන්ධයෙන් ආයතනික හා රේඛීය අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සාකච්ජා කරන ලදී. ඒ අනුව අවශ්‍ය ඇප තැබීම් පිළිබඳව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | රජයේ නිලධාරීන්ගෙන් ඇප ආඥා පනතට අනුකූලව ඇප ලබාගත යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.740,009 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.506,418 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.233,591ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයෙන් ලද ප්‍රදාන රු.5,339,802 කින් වැඩි වීම සහ පාඨමාලා ආදායම් රු.247,000 කින් වැඩි විම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(අ) පසුගිය වර්ෂ පහක මණ්ඩලයේ එකතු වූ අගයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ .

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| බදු පසු අතිරික්තය/ඌනතාවය | 740,009 | 506,418 | 480,595 | (791,842) | (1,490,967) |
| <u>එකතුකළා</u> | | | | | |
| සේවක වැටුප් | 12,338,121 | 10,739,610 | 10,606,412 | 10,496,159 | 8,515,485 |
| ක්ෂය | <u>1,896,724</u> | <u>1,504,025</u> | <u>1,424,482</u> | <u>1,430,183</u> | <u>1,427,924</u> |
| මණ්ඩලයේ එකතු අගය | 14,234,845 | 12,750,053 | 12,511,489 | 11,134,500 | 8,452,442 |
| පසුගිය වසරට සාපේක්ෂව අඩු /වැඩිවීමේ ප්‍රතිශතය | 12% | 2% | 12% | 32% | |

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 සහ 2015 වර්ෂයන්හිදී මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එය අතිරික්තයක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2017 වර්ෂයේ දී රු.12,750,053 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු.14,234,845 ක් දක්වා සියයට 12 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන පුවත්පත් කලාවේදීන් සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට අනුව දිනපතා පළවන පුවත්පත් විමර්ශනය කර බැලීම සඳහා ක්‍රමවේදයක් පැවතියද පළවන පුවත්පත් ප්‍රමාණය හා සසඳන කළ සීමිත විමර්ශන වාර්තා ප්‍රමාණයක් පමණක් ඉදිරිපත් කර තිබුණි .එකී විමර්ශන වාර්තා සම්බන්ධයෙන් ද ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණි. | ඉදිරියේ දී මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වැඩි අවධානයක් යොමු කරනු ඇත. | විමර්ශන වාර්තා සම්බන්ධ සහ ආචාරධර්ම පිළිපැදීම පිළිබඳව අවශ්‍ය ඇගයීම් සිදුකිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමාණවත් අවධානයක් යොමුවිය යුතුය. |

| | | |
|---|---|---|
| (ii) 2010 මැයි 14 දිනැති අංක සීඒ1/17/1/ දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 1 ඡේදය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජූලි 10 දිනැති අංක 7 නියෝගය අනුව පුවත්පත් මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු බව අවධාරණය කර තිබුණද මණ්ඩලය ආරම්භයේ සිට වසර 40 ක පමණ කාලයක් තුළ කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබුණ අතර , ඒ වෙනුවෙන් 2010 සිට 2018 වර්ෂය දක්වා පමණක් ගොඩනැගිලි කුලී වශයෙන් රු.19,122,400 ක් වැයකර තිබුණි. රජයේ ගොඩනැගිල්ලක් සපයා ගැනීමට ඇති අපහසුතාවය මත මෙම තත්ත්වය උද්ගතවී ඇති බව මණ්ඩලයේ සභාපතිවරයා විගණනයට වාර්තා කර තිබුණි. | මේ සම්බන්ධව අවස්ථා ගණනාවකදීම රේඛීය අමාත්‍යාංශය මගින් හා මණ්ඩලයේ සෘජු මැදිහත්වීම මත අවශ්‍ය කටයුතු සිදු කළ ද ඒ සඳහා ප්‍රතිචාර නොලැබුණි. ඒ අනුව රජයේ ගොඩනැගිල්ලක් තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කර බැලුවද ගොඩනැගිල්ලක් සොයාගැනීම දුෂ්කර වී ඇත. | රජයේ ආයතන සමග තවදුරටත් සාකච්ඡා කළ යුතු වේ. |
| (iii) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් සිදුකර පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ගිවිසුමකට එළඹ ඒ වෙනුවෙන් රු. 200,000 ක අත්තිකාරම් මුදලක් කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අංශය වෙත 2015 නොවැම්බර් 24 දින ගෙවා තිබුණු අතර සමස්ත පර්යේෂණ වාර්තාව එම ගෙවීමෙන් මාසයක් ඇතුළත ඉදිරිපත් කළ යුතුව තිබුණ ද 2019 මැයි 03 දිනවන විටත් එම වාර්තාව මණ්ඩලය වෙත ඉදිරිපත්කර නොතිබුණි. | තවදුරටත් වාර්තාව ලබා ගැනීමට උත්සාහ දරනු ලැබේ. | වාර්තාව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iv) 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2008/05 ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් තම ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතු වුවද එවැන්නක් පිළිබඳ මණ්ඩලය දැනුවත්ව නොතිබුණු අතර චක්‍රලේඛයේ ඇතුළත් විධි විධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කෙරේ. | පුරවැසි ප්‍රඥාප්තිය හඳුන්වා දී ක්‍රියාත්මක කළයුතුවේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) පුවත්පත් මණ්ඩල පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ පරමාර්ථ හා ඊට අනුෂාංගික කාර්යයන් වූ ජනමාධ්‍යවේදීන් සඳහා වැඩමුළු පැවැත්වීම, පොත් මුද්‍රණය කිරීම, ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම සහ ජනමාධ්‍යවේදීන් සඳහා ශබ්ද කෝෂයක් පිළියෙල කිරීම ආදිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රජයෙන් ලද රු.29,094,802 ක ප්‍රදානයන්ගෙන් රු.4,063,736 ක් හෙවත් සියයට 14 ක් පමණක් වියදම් කර තිබුණි. | ඉල්ලන ලද මුදලට වඩා රු.මිලියන 6 ක් අඩුවෙන් ප්‍රතිපාදන ලැබුණි. ගොඩනැගිලි කුලී හා වැටුප් වැනි වියදම් දැරීමෙන් පසු ඉතිරිය පනතේ අරමුණු සඳහා යෙදවුණි. | මණ්ඩලයේ පරමාර්ථ හා ඊට අනුෂාංගික කාර්යයන් සඳහා වැඩි අවධානයක් යොමුවිය යුතුය. |
| (ii) පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව සෑම පුවත්පතක්ම පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු අතර එලෙස ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත්කරන පුවත්පත් සම්බන්ධව අවශ්‍ය රීති හා නියෝග සම්පාදනය කිරීමට පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව බලය තිබුණද , මණ්ඩලය විසින් ඒ සඳහා රීති පිළියෙල කර නොතිබුණි. ලියාපදිංචි කළ යුතු පුවත්පත් සංඛ්‍යාව ලෙස මණ්ඩලය තක්සේරු කළ සංඛ්‍යාව 300ක් වුවද 2017 සහ 2018 වර්ෂවල ලියාපදිංචි කළ පුවත්පත් සංඛ්‍යාව පිළිවෙලින් 199ක් සහ 118ක් විය. නමුත් වෙළඳපල තුළ ලියාපදිංචියකින් තොරව අලෙවිය සිදුකරන පුවත්පත් පිළිබඳව විමර්ෂණ කිරීමට මණ්ඩලය කටයුතුකර නොතිබුණි. | මුද්‍රණ වියදම් ඉහල යාම නිසා පුවත්පත් මුද්‍රණය පහල ගොස් ඇත. (තක්සේරු කළ සංඛ්‍යාව 300 ක් වුවද පුවත්පත් සංඛ්‍යාව 75 කි.<br>ඉතිරිය සඟරා වේ.) | ලියාපදිංචියකින් තොරව අලෙවිය සිදුකරන පුවත්පත් පිළිබඳව විමර්ෂණය කිරීමට මණ්ඩලය කටයුතු කළ යුතු වේ. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලය විසින් පිළිවෙලින් 1993 නොවැම්බර් 05 සහ 2009 සැප්තැම්බර් 07 යන දිනයන් හි ආරම්භ කරන ලද පර්යේෂණ අරමුදල සහ ණය අරමුදල සඳහා බැංකු ගිණුම් දෙකක් පවත්වාගෙන යනු ලබන අතර රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා 2017 ලිපියක් ඉදිරිපත් කර තිබුණද 2019 මැයි 03 දින වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුම්වල ශේෂ පිළිවෙලින් රු.3,397,953ක් සහ රු.1,685,259 ක් විය. | "මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය" අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ සාකච්ජා වාර කිහිපයක් පැවැත්වූ අතර, එහිදි ලේකම්තුමා දන්වා සිටියේ පර්යේෂණ අරමුදල හා ණය අරමුදල යන ගිණුම් දෙක සඳහා අනුමැතියක් ලබාදීමේ හැකියාවක් ඇති බවය. කෙසේ වෙතත් මේ සම්බන්ධව 2016/05/27, 2016/08/02, 2017/12/19,2018/05/10, 2018/06/18 දිනැති ලිපිය මගින් වරින් වර රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඉල්ලීම් කර ඇත. | අනුමැතිය ලබා ගත යුතු වේ. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යභාරයන් වූ පාසල් සිසුන්ගේ සිතීමේ සහ ලිවීමේ හැකියාව වර්ධනය සඳහා වන රචනා තරඟය පවත්වා නොතිබුණු අතර මාධ්‍යවේදීන්ගේ උනන්දුව ඉහළ නැංවීම සඳහා සන්නිවේදන සාකච්ඡා 50 ක් පැවැත්වීමට සැලැසුම් කර රු.125,000 ක් වෙන් කර තිබුණ ද සාකච්ඡා 7 ක් පමණක් පවත්වා ඒ වෙනුවෙන් රු. 4,500 ක් වැය කර තිබුණි. | 2019 වසරේ 2 වන කාර්තුව වන විට අවසන් කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වීමට උත්සාහ දැරිය යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 133 හා මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවන අතර මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණන තනතුරක් ඇතුළත් කර නොතිබුණි. | මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යාංශයේ පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වල දී ලද උපදෙස් පරිදි මණ්ඩලයේ ස්ථිර තනතුරක් නොමැති බැවින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන්ම එම සේවාව ලබා ගැනීමට උපදෙස් දෙන ලදී. | අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සහයෝගය ලබාගත යුතුය. |

## 4.3 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 /දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව, අවම වශයෙන් කාර්තුවකට වරක් බැගින් වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී කමිටු රැස්වීම් 2ක් පමණක් පවත්වා තිබුණි. | එකඟ වේ. | අවම වශයෙන් කාර්තුවකට වරක් බැගින් වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. |

## 4.4 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයවැයගත හා තත්‍ය ආදායම් අතර සියයට 39 සිට සියයට 132 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | නිවැරදිව අයවැය ගත කිරීමට ඉදිරියේ දී කටයුතු කෙරේ. | අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගත යුතුය. |

## 4.5 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය’’ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් මණ්ඩලය විසින් සිය විෂය පථයට අනුව ලගා කර ගත යුතු අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රතිපාදන වෙන්කිරීම, අවශ්‍ය මානව හා භෞතික සම්පත් හඳුනාගැනීම, තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් (Stakeholders) හඳුනාගැනීම ආදී කාර්යයන්ද සමාලෝචිත වර්ෂය තුළ සිදුවී නොතිබුණි. | මෙයට අනුගත වීමට ඉදිරියේ දී කටයුතු කෙරේ. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය ’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතී. |